සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 32 S

ගණිතය - I කොටස

නම ..............................................

කාලය පැය දෙකයි


උපදෙස් : ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

(01) 3,6,9,12, ..... සංඛ්‍යා රටාවේ සාධාරණ පදය සොයන්න.


(02) සුළු කරන්න.

$$\frac{1}{5}+\frac{2}{5}$$

(03) පරිමිතිය සොයන්න.




(04) $x$ හි අගය සොයන්න.




(05) සුළු කරන්න.

-8-(-5)

(06) විසඳන්න $x-2=8$

(07) $900 = 2 \times 2 \times 3 \times 3 \times 5 \times 5$ ඇසුරින් $\sqrt{900}$ හි අගය සොයන්න.

(08) සුළු කරන්න. $1.02 \times 100$

(09) 3,4,6 හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(10) සුළු කරන්න. $2(3x-1)$

(11) එළවළු තොගයක ස්කන්ධය $1050kg$ වේ. මෙම ස්කන්ධය ටොන් වලින් දක්වන්න.


(12) $x$ හි අගය සොයන්න. $(2 \times 5)^x = 2^2 \times 5^x$

(13) සාධක සොයන්න. $ax + 2a$


(14) රූපයේ පරිදි පතොරම් දෙකක් සපයා දුන් විට සෑදිය හැකි ඝණ වස්තුවේ

i. නම කුමක් ද?

ii. මුහුණත් ගණන කීයද?




(15) පහත දැක්වෙන සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න.




(16) A = { 1 ත් 10 ත් අතර ඉරට්ට සංඛ්‍යා }
මෙම කුලකය වෙන් රූපයක් මඟින් දක්වන්න.

(17) $x$ හි අගය සොයන්න.




(18) සීනි 600$g$ ක මිල රු. 60 කි. සීනි 1$kg$ ක මිල සොයන්න.

(19) කේන්ද්‍රය O වන වෘත්තයක් මත A ලක්ෂ්‍යක් පිහිටා ඇත. OA = 8$cm$ නම් එම වෘත්තයෙහි විෂ්කම්භය සොයන්න.

(20) ප්‍රතිශතයක් ලෙස දක්වන්න. $\frac{2}{5}$

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

| **8 ශ්‍රේණිය** | **පළමු වාර පරීක්ෂණය - 2019** | **32 S** |
|---|---|---|

**ගණිතය - II කොටස**


නම ...............................................

**උපදෙස් : පළමු ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්ණ 05 කට පිළිතුරු සපයන්න.**

(01) ඝණ වස්තු සම්බන්ධව පන්ති කාමරයේ දී ගුරුතුමා/ගුරුතුමියගේ මඟපෙන්වීම යටතේ ඔබ සිදුකරන ලද ක්‍රියාකාරකම සිහිපත් කර ගනිමින් පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

i. ඝණ වස්තුවක දාර, ශීර්ෂ හා මුහුණත් සම්බන්ධව ඔයිලර් සූත්‍රය ලියන්න. (ල. 03)
ii. ඔබ විසින් සාදන ලද ඝන වස්තුවක් නම් කර ඔයිලර් සම්බන්ධව තහවුරු කරන්න. (ල. 03)
iii. සවිධි චතුස්තලයක මුහුණතක නිවැරදි හැඩය ඇඳ එහි නම ලියන්න. (ල.03)
iv. ඉහත ඔබ විසින් අඳින ලද හැඩය භාවිතා කර සෑදිය හැකි වෙනත් ප්ලේටෝ කැට දෙකක නම ලියන්න. (ල. 03)
v. අෂ්ඨතලය සෑදීමට භාවිතා වන මුහුණත් හා ඝනකාභයක මුහුණත් යන හැඩයන් භාවිතා කර සෑදිය හැකි සංයුක්ත ඝන වස්තුවක නම ලියා එහි රූප සටහනක් අඳින්න. (ල. 04)

(02) රූප සටහනේ දැක්වෙන පරිදි AB හා CD සරල රේඛා වේ. දී ඇති දත්ත ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




$C\hat{O}F = 45^0$
$A\hat{O}D = 80^0$
$B\hat{O}E = 90^0$
$B\hat{O}F = x$

i. $x$ හි අගය සොයන්න. (ල. 03)
ii. $A\hat{O}C$ අගය කීයද? (ල. 02)
iii. $A\hat{O}C$ ට පරිපූරක බද්ධ කෝණයක් ලියන්න. (ල. 02)
iv. $B\hat{O}G$ ට අනුපූරක කෝණයක් ලියන්න. (ල. 02)
v. $D\hat{O}E$ හි අගය කීයද? (ල. 02)

(03) a) සුළු කරන්න.
$(xy)^2$ (ල. 02)

b) (i) දී ඇති සදිශ සංඛ්‍යා සංඛ්‍යා රේඛාව භාවිතා කර අඩු කරන්න.

$+4 - (-2)$ (ල. 03)

(ii) $\frac{7 \text{ x } (-4)}{(-2)}$ (ල. 02)


c) පහත දැක්වෙන සංඛ්‍යාවක් ප්‍රථමක සංඛ්‍යාවන්හි ගුණයක් ලෙස ලියන්න. (ල. 02)
72 =
50 =

(ii) $\sqrt{72 \text{ x } 50}$ හි අගය සොයන්න. (ල. 02)


(04) (a) සහල් ගබඩාවක ස්කන්ධය $25t$ වන සහල් ගබඩා කර ඇත.

(i) එම සහල් $10kg$ පැකට් ලෙස අසුරයි නම් ගබඩා කර ඇති සහල් පැකට් ගණන කොපමණද? (ල.03)

(ii) මෙම සහල් බෙදා හැරීම සඳහා $2000kg$ උපරිම වශයෙන් බර දැරිය හැකි ලොරි රථ යොදාගනී නම් අවශ්‍ය ලොරි රථ සංඛ්‍යාව කොපමණද? (ල.02)


(b)  මඟින් දැක්වෙන රූපයෙහි පරිමිතිය $5cm$ නම් පහත දැක්වෙන තල රූපයන්හි පරිමිතිය සොයන්න.

(I)




(ල.02)

(ii)



(ල.02)

(c) පහත දැක්වෙන සංයුක්ත රූපයෙහි පරිමිතිය සොයන්න. (ල.02)




(ල.02)

(05) (a) එක්තරා වෙළෙන්දෙකු තමා සතු අඹ තොගයක් අතරින්, අඹ ගෙඩියක මිළ රු. 10 බැගින්, අඹ ගෙඩි $a$ ප්‍රමාණයක් අලෙවියෙන් පසු නැවත එම මිළටම අඹ ගෙඩි 3 ක් අලෙවි කරන ලදී.

(I) අලෙවි කරන ලද මුළු අඹ ගෙඩි සංඛ්‍යාව සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩනගන්න. (ල.02)

(ii) අඹ අලෙවියෙන් ලද මුළු මුදල සඳහා වරහන් සහිත ප්‍රකාශනයක් ලියා එය සුළු කරන්න. (ල. 03)

(b) සුළු කරන්න $2(x-2y)-5x+6y-1$ (ල. 03)

(c) $x=-2, y=3$ නම් $5x(3y-1)$ හි අගය සොයන්න. (ල. 03)

(06)(a) 1,3,5 යන සංඛ්‍යා රටාව සළකන්න.

(i) ඊළඟ පද දෙක ලියන්න. (ල. 02)

(ii) ඉහත රටාවේ සාධාරණ පදය සොයන්න. (ල. 03)

(iii) ඉහත සංඛ්‍යා රටාවේ 45 වන්නේ කී වැනිපදය ද? (ල. 02)

(b) සුළු කරන්න.

(i) $\frac{2}{5}+\frac{3}{10}$ (ල. 02)

(ii) $\frac{1}{6}+\frac{1}{3}$ (ල. 02)

(07) (a) පහත දැක්වෙන වීජීය ප්‍රකාශණයන්හි සාධක සොයන්න.

(i) $4x - 20$ (ල. 02) (ii) $6a + 3ab$ (ල. 02)

(b) සුළු කරන්න.

(i) $\dfrac{x^3 \times x^8}{x^9}$ (ල. 02) (ii) $(x^2 y^3)^2$ (ල. 01)

(c) (i) මහා පොදු සාධකය සොයන්න


$6x$ හා $8x$ (ල.02)

(ii) එමඟින්,

$6xy - 8x$ හි සාධක සොයන්න. (ල.02)

# පළමු වාර පරීක්ෂණය - 2019
## ගණිතය පිළිතුරු පත්‍රය
## I කොටස


08 ශ්‍රේණිය

| ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු | ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3n | | 02 | 17 | $x = 45^0$ | | 02 |
| 02 | $\frac{3}{5}$ | | 02 | 18 | 100 g ——— රු. 10<br>රු. 100/= | 01 | 02 |
| 03 | (7 x 2 +5 x 2 +3 x 2)<br>30 cm | 01 | 02 | 19 | 16 cm | | 02 |
| 04 | $35^0$ | | 02 | 20 | $\frac{2}{5}$ x 100%<br>40% | 01 | 02 |
| 05 | -8 + 5<br>-3 | 01 | 02 | | | | |
| 06 | x - 2+2 = 8+2<br>x= 10 | 01 | 02 | | | | |
| 07 | 2 x 3 x 5<br>= 30 | 01 | 02 | | | | |
| 08 | 102 | | 02 | | | | |
| 09 | 12 | | 02 | | | | |
| 10 | 6x - 2 | | 02 | | | | |
| 11 | $\frac{1050}{1000}$<br>1.05 | 01 | 02 | | | | |
| 12 | 2 | | 02 | | | | |
| 13 | a (x+2) | | 02 | | | | |
| 14 | i. දාෂ්ටී තලය<br>ii. 8 | 01<br>01 | 02 | | | | |
| 15 | 3 x8<br>$24cm^2$ | 01 | 02 | | | | |
| 16 |  | | 02 | | | | |

- - www.mathspapers.info - -

# පළමු වාර පරීක්ෂණය - 2019
## ගණිතය පිළිතුරු පත්‍රය
## II කොටස

08 ශ්‍රේණිය

| ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | i. මුහුණත් + ශීර්ෂ = දාර + 2 | 03 | |
| | ii. නම් කිරීම<br>තහවුරු කිරීම | 01<br>02 | |
| | iii.  සමපාද ත්‍රිකෝණය | 03 | |
| | iv. සවිධි චතුස්තලය<br>ද්වාදස තලය | 03 | |
| | v. රූප සටහන<br>නම | 03<br>01 | 16 |
| 02 | i. $35^0$ | 02 | |
| | ii. $100^0$ | 02 | |
| | iii. $A\hat{O}D$ or | 03 | |
| | iv. $E\hat{O}G$ | 02 | |
| | v. $10^0$ | 02 | 11 |
| 03 | (a) i. $x^2\ y^2$ | 02 | |
| | (b) i. 4+ (+2)<br>6 | 02<br>01 | |
| | ii. $\frac{-28}{-2}$<br>14 | 01<br>01 | |
| | (c) i. 72 = 2 x 2 x 2 x 3 x 3 | 01 | |
| | 50 = 2 x 5 x 5 | 01 | |
| | ii. $\sqrt{2 \times 2 \times 2 \times 2 \times 3 \times 3 \times 5 \times 5}$ | 01 | |
| | 60 | 01 | 11 |
| 04 | (a) i. $\frac{25000}{10}$ | 02 | |
| | 2500 | 01 | |
| | ii. 13 | 02 | |
| | (b) i. 10 cm | 02 | |
| | ii. 15 cm | 02 | |
| | (c) 44 cm | 02 | 11 |

| ප්‍ර.අං | පිළිතුර | කොටසකට ලකුණු | මුළු ලකුණු |
|---|---|---|---|
| 05 | (a) i. a + 3 | 02 | |
| | ii. 10 (a +3)<br>10a + 30 | 02<br>01 | |
| | (b) i. 2x - 4y - 5x + 6y - 1<br>-3x - 4y - 1 | 02<br>01 | |
| | (c) i. 5 x (-2) (3x 3 - 1)<br>-10 x 8<br>-80 | 03 | 11 |
| 06 | (a) i. 7,9 | 02 | |
| | ii. 2 n<br>2n - 1 | 02<br>01 | |
| | iii. 2n - 1 = 45<br>$\frac{2n}{2} = \frac{46}{2}$<br>n = 23 | 02 | |
| | (b) i. $\frac{4}{10} + \frac{3}{10}$<br>$\frac{7}{10}$ | 02 | |
| | ii. $\frac{1}{6} + \frac{2}{6} = \frac{3}{6}$<br>$\frac{1}{2}$ | 02 | 11 |
| 07 | (a) i. 4 (x-5)<br>ii. 3a (2+b) | 02<br>02 | |
| | (b) i. $\frac{x^{11}}{x^9}$<br>$x^2$ | 02 | |
| | ii. $x^4\ y^6$ | 01 | |
| | (c) i. 2x | 02 | |
| | ii. 2x (3y - 4) | 02 | 11 |

ඔබට අවශ්‍ය සියලුම ගණිත ප්‍රශ්න පත්‍ර ( mathspapers.info ) වෙතින් පහසුවෙන්ම ලබාගන්න